සියලුම හිමිකම් ඇවිරිණි.
All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# දෙවන වාර පරීක්ෂණය 2018

**10 ශ්‍රේණිය** | **ඉතිහාසය - I** | **කාලය පැය 01 යි.**

| නම/ විභාග අංකයඃ |
|---|

සැලකිය යුතුයි :
- සියලුම ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.
- අංක 01 සිට 40 දක්වා ප්‍රශ්නවලට දී ඇති 1, 2, 3, 4 පිළිතුරු වලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන පිළිතුර තෝරන්න.
- ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරින් තෝරාගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ (x) ලකුණ යොදන්න.

---

01. මෙරට ඉතිහාසය හැදෑරීමට ඇති සාහිත්‍ය මූලාශ්‍ර අතර ධර්ම ග්‍රන්ථ ගනයට අයත් කෘතියකි.
   (1) පූජාවලිය (2) නිකාය සංග්‍රහය (3) රාජාවලිය (4) පැරකුම්බා සිරිත

02. දීපවංශය පිළිබඳ නිවැරදි ප්‍රකාශය ඇතුලත් පිළිතුර මින් කුමක්ද?
   (1) දීපවංශය රචනා කිරීමේ දී සිහලට්ඨ කථා , උත්තර විහාරට්ඨ කථා , විනයට්ඨ කථා ආදී මුල් ග්‍රන්ථවල ආභාෂයන් ලබා ඇත.
   (2) ක්‍රි.ව. 5 , 6 සියවස් වල රචනා කර ඇත.
   (3) අඛණ්ඩ ඉතිහාසයක් ගොඩනැගීමට උදව් වී ඇත.
   (4) දේශීය සාහිත්‍ය මූලාශ්‍ර අතර පැරණිතම මූලාශ්‍රය වේ.

03. ශ්‍රී ලංකාවේ ජාතික උරුමයක් වූ පුරාවස්තු රැක ගැනීම කළ යුතු වන්නේ මින් කවර කරුණක් නිසාද?
   (1) මතු පරපුරට පෙන්විය යුතු නිසා.
   (2) ශ්‍රී ලාංකීය අනන්‍යතාවය පෙන්නුම් කළ හැකි නිසා.
   (3) සංචාරක ව්‍යාපාරයේ වර්ධනයට හේතුවන නිසා.
   (4) අතීත පාලකයින්ගේ කටයුතු ගැන අවබෝධයක් ලබාගත හැකි නිසා.

04. සෙල්ලිපි හා සම්බන්ධයෙන් පහත ප්‍රකාශ අතරින් සාවද්‍ය ප්‍රකාශය වනුයේ,
   (1) ක්‍රි.පූ. 02 සියවසේ සිට මහනුවර රාජ්‍ය සමය දක්වා ශිලා ලේඛන ලිවීම අඛණ්ඩව පැවැතිනි.
   (2) සාහිත්‍ය මූලාශ්‍රවල ඌනතා පූරණය කිරීමට සෙල්ලිපි සමත් වේ.
   (3) මෙරට පැරණිම ශිලා ලේඛන ටැම් ලිපි ලෙස හඳුන්වයි.
   (4) පැරණිම ශිලා ලිපි ලියා ඇත්තේ භික්ෂූන්ට ලෙන් පිදීම වැනි දේ වාර්තා කිරීමටය.

05. මුල් ඓතිහාසික යුගයේ පැරණි ගම් වල දැකිය හැකි ලක්ෂණයක් නොවන්නේ,
   (1) වැසි ජලයෙන් පෝෂණය වන කුඩා වැව් කේන්ද්‍ර කොටගෙන ඇත.
   (2) ගංගා පිටාර නිම්නවල ගම් බිහි වී ඇත.
   (3) සුමනවාපී විහාරවාපී ලෙස හැඳින් වූ ගම් පැවැතී ඇත.
   (4) එකිනෙකට ස්වාධීන වූ ගම් බිහිවී ඇත.

06. මුල් ඓතිහාසික යුගයට අයත් පැරණි ගමකි.
   (1) බෙරගල (2) උඩරංචාමඩම (3) හල්දුම්මුල්ල (4) වළගම්පත්තුව

07. වසභ රජුගේ කාලයේදී යාපනය පාලනය කළ ඊෂිගිරි නම් ඇමතියෙකු පිළිබඳව සඳහන් වන අභිලේඛනය,
   (1) ගල්පොත ශිලා ලේඛනය (2) පනාකඩුව තඹ සන්නස
   (3) වල්ලිපුරම් රන්පත (4) අඹගමුව ශිලා ලේඛනය

08. I වන කාශ්‍යප රජතුමාට භාවිතා කළ රාජ්‍යත්ව සංකල්පය වනුයේ,
   (1) චක්‍රවර්තී (2) අලකපය මහරජ (3) නරඉසෙර (4) දේවත්ව

09. ශ්‍රී ලංකාවේ දේශපාලන බලය මධ්‍යගත වීමෙන් පසු ගොඩනැගුණු රාජ්‍ය පරිපාලන සැකැස්මට අයත් නිළධාරීන් නිවැරදිව ගැලපූ විට ලැබෙන පිළිතුර වන්නේ මින් කුමක්ද?

1. රාජ්‍ය ලේඛන ප්‍රධානි — A පන අදෙක
2. වෙළඳ කටයුතු භාර ප්‍රධානී — B රූප අදෙක
3. කාසි අච්චු ගැසීමේ ප්‍රධානී — C කණපෙඩික
4. වත් සිරිත් චාරිත්‍ර අධිකාරී — D කොතුරු ගැ නා
E බතගු

(1) BACD (2) CABD (3) CBAD (4) ACBD

10. පහත දක්වෙන්නේ ශ්‍රී ලංකාවේ පැරණි වරායක් හැඳින් වූ නම් හා ඒවා වර්තමානයේ හඳුන්වන නම්ය. ඒවා නිවැරදිව ගැලපූ විට පිළිතුර වන්නේ මින් කුමක්ද?

1. කාලතිත්ථ — A මන්නාරම
2. ගෝකණ්ණ තිත්ථ — B බෙන්තොට
3. මහා තිත්ථ — C ගාල්ල
4. භීම තිත්ථ — D කලුතර
E ත්‍රිකුණාමලය

(1) DEAB (2) ECDA (3) CEAB (4) BEDA

11. භාෂා ආගම් අතින් වෙනස් වුවද තමන්ගේ අසල්වාසි රටවල ප්‍රජාව දෙස විශ්වාසවන්ත ලෙස කටයුතු කිරීම අපේ පැරණි පාලකයන්ගේ විදේශ ප්‍රතිපත්තිය තුළ කැපීපෙනෙන ලක්ෂණයකි. එසේ කටයුතු කළ පාලකයෙක් වන්නේ කවුරුන්ද?

(1) වසභ රජතුමා (2) I ගජබාහු රජතුමා (3) I විජයබාහු රජතුමා (4) දුටුගැමුණු රජතුමා

12. රජරට ශිෂ්ටාචාර සමයට අයත් සංස්කෘත භාෂාවෙන් රචිත ග්‍රන්ථයකි.

(1) අභිධානප්පදීපිකා (2) ජානකීහරණය (3) සියබස්ලකර (4) සාරත්ථදීපනී

13. ත්‍රිපිටකයට අටුවා රචනා කළ විදේශික හිමිනම ඇතුළත් පිළිතුර කුමක්ද?

(1) බුද්ධඝෝෂ හිමි (2) මහානාම හිමි (3) පාහියං හිමි (4) හියුන්සාං හිමි

14. කැති අඩ , කෙටු කනබ අය ලෙස සෙල්ලිපිවල දක්වා ඇත්තේ කුමක්ද?

(1) ගොවිතැනේදී භාවිතා කළ උපකරණ දෙකකි. (2) හෙන් ගොවිතැනේදී අය කළ බදු වර්ග දෙකකි.
(3) රජු යටතේ සිටි නිළධාරීන් දෙදෙනෙකි. (4) රජ කාලයේ දුන් දඬුවම් දෙකකි.

15. පත්තිනි දේවාලයක් විවෘත කිරීමට දකුණු ඉන්දියාවේ චේර රාජ්‍යයට ගිය ලංකාවේ ලම්බකර්ණ වංශික රජතුමා මින් කවුරුන්ද?

(1) වසභ රජු (2) I ගජබාහු රජු (3) යසලාලක තිස්ස රජු (4) උපතිස්ස රජු

16. පාණ්ඩ්‍ය දේශයේ කුමරෙකු සමග විවාහ සබඳතාවක් ගොඩ නගා ගත් I වන විජයබාහු රජුගේ සොහොයුරිය කවුරුන්ද?

(1) තිලෝකසුන්දරී (2) සංඝමිත්තා (3) මිත්තා (4) අනුලා

17. ඓතිහාසික හා පුරාවිද්‍යාත්මක මූලාශ්‍රය වලට අනුව මෙරට වඩාත් පැරණිම ගොවිතැන් ක්‍රමය වනුයේ පහත පිළිතුරු අතරින් කුමක්ද?

(1) කුඹුරු ගොවිතැන (2) හෙන් ගොවිතැන (3) ගොඩ ගොවිතැන (4) වතුවගාව

18. හතරවන කාශ්‍යප රජතුමා විසින් කොටවන ලද සෙල්ලිපියක " කිරි ගෙරි " යනුවෙන් හඳුන්වා ඇත්තේ ?

(1) කිරි ලබාගැනීම සඳහා ඇතිකරන ගවයින්ය.
(2) කිරි වලින් සකස් කරන ලද ආහාර වර්ගයකි.
(3) අතීතයේ භාවිතා කළ දඬුවම් ක්‍රමයකි.
(4) පැරණි සමාජයේ වැසියන්ගෙන් අයකළ බදු වර්ගයකි.

19. අනුරාධපුර පළාතේ ගැමියෝ " කනත්ත " ලෙස හඳුන්වා ඇත්තේ පහත පිළිතුරු අතරින් කුමක්ද?

(1) පැළෑටි නවයක් සරුවට දළු ලා වැඩුනු හේන්ය.
(2) අලුතෙන් ගිනි තැබූ බිම්ය.
(3) කාලයක් අතහැර දමා යළි වගා කිරීම ඇරඹූ හේන්ය.
(4) මියගිය මිනිසුන්ගේ මළමිනී වල දැමූ බිම්ය.

20. ' දතික සුමන ' නම් ශිල්පියා පහත සඳහන් කුමන කර්මාන්තයක් හා සම්බන්ධ වේද?

(1) තඹ කර්මාන්ත (2) කුඹල් කර්මාන්ත
(3) පන් කර්මාන්තය (4) ඇත්දත් කැටයම් කර්මාන්තය

21. පුරාණයේ වෙළඳපළවල් සංවිධානාත්මක ලෙස ක්‍රියාත්මක වූ ආකාරය පැහැදිලි වන සෙල්ලිපියක් වන්නේ මින් කුමක්ද?

(1) තෝනිගල සෙල්ලිපිය (2) මිහින්තලේ පුවරු ලිපිය

(3) හෝපිටිගමුව ටැම් ලිපිය (4) ගොඩවාය සෙල්ලිපිය

22. නායක තෙරුන් වහන්සේලා සමීපයේ විසූ ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා සෙල්ලිපිවල හඳුන්වා ඇති නම කුමක් ද?

(1) ථෙර (2) අන්තේවාසික (3) සදිවිහරිය (4) වසවසික

- **ප්‍රශ්න අංක 23 , 24 සඳහා ශ්‍රී ලංකා සිතියම ඇසුරින් පිළිතුරු සපයන්න.**




23. මෙහි දක්වා ඇති සිතියමේ තිරුකේතීශ්වරම් කෝවිල දැක්වෙන අක්ෂරය වන්නේ කුමක් ද?

(1) A (2) B

(3) E (4) F

24. ශ්‍රී දන්ත ධාතුව රැගෙන හේමමාලා සහ දන්ත කුමරු මෙරටට ගොඩබට වරාය දැක්වෙන අක්ෂරය කුමක්ද?

(1) A (2) B

(3) E (4) F

25. අරාබි ජාතිකයින් පුරාණයේදී ලංකාව හඳුන්වා ඇත්තේ කුමන නමකින්ද?

(1) තැප්‍රොබානා (2) සෙරන්ඩිබ් (3) සීලන් (4) මස්ලික්වාල්

26. රජරට ශිෂ්ටාචාර සමයට අයත් පහත සඳහන් සාහිත්‍ය කෘති අතරින් පාලි භාෂාවෙන් රචිත කෘති පමණක් අඩංගු පිළිතුර කුමක්ද?

(1) දීපවංශය , සාරත්ථදීපනී , අභිධානප්පදීපිකා

(2) සාරප්ථදීපනී , බාලාවබෝධය , ජානකීහරණය

(3) ජානකීහරණය , බාලාවබෝධය , අනුරුද්ධ සතකය

(4) සියබස්ලකර , ජානකීහරණය , අනුරුද්ධ සතකය

27. A තීරුවේ දැක්වෙන පරිදි ලංකාවට පැමිණි විවිධ ජන කණ්ඩායම් B තීරුවේ දැක්වෙන පරිදි ඔවුන් පැමිණි ප්‍රදේශ සමග නිවැරදිව ගැලපූ විට ලැබෙන පිළිතුර තෝරන්න.

| A | B |
|---|---|
| 1. ජාවක වරු | A ඉන්දියාව |
| 2. කාම්බෝජ වරු | B මැසිඩෝනියාව |
| 3. අයෝනියන් වරු | C ඇප්ගනිස්ථානය |
| | D මලය අර්ධද්වීපය |

(1) BCD (2) BDC (3) DCB (4) DBA

28. ඉන්දියානු කුලී හේවායන්ගේ පිහිට පැතූ ප්‍රථම ලාංකික රජවරු දෙදෙනා දැක්වෙන පිළිතුර තෝරන්න.

(1) මහානාග - ඉලනාග (2) අභයනාග - මහානාග

(3) මහානාම - අභයනාග (4) ඉලනාග - අභයනාග

29. ක්‍රිස්තු වර්ෂ නවවන සියවසේ පටන් සමනල කන්ද " ආදම්ගේ කන්ද " යන විශ්වාසයෙන් වන්දනාවට ලක් කළ ආගමිකයන් කවුරුන්ද?

(1) හින්දු (2) ඉස්ලාම් (3) බෞද්ධ (4) කතෝලික

30. ප්‍රාග් ඓතිහාසික මානවයා පැල්පත් තනා ජීවත් වන්නට ඇතැයි අනුමාන කළ හැකි සාධක හමුවන ස්ථානයක් වන්නේ,

(1) කිතුල්ගල බෙලිලෙන (2) පාහියංගල ලෙන (3) බටදොඹ ලෙන (4) අලුලෙන

31. ඓතිහාසික යුගයේ මහ වැව් තැනීමේ අරමුණක් නොවන්නේ මින් කවරක් ද?

(1) කෘෂිකාර්මික කටයුතු සඳහා (2) ජලවිදුලිබල නිෂ්පාදනය සඳහා

(3) ගංවතුර පාලනය සඳහා (4) නාගරික ජන අවශ්‍යතා සඳහා

32. භික්ෂූන් වහන්සේලාගේ ප්‍රයෝජනය සඳහාත් අලංකාරය හා ස්නානය සඳහාත් ඉදිකර තිබෙන පහත පොකුණු අතරින් පොළොන්නරුවේ දී දක ගත හැකි පොකුණු ඇතුළත් පිළිතුර කුමක් ද?

(1) ඇත්පොකුණ - නෙලුම් පොකුණ (2) කුට්ටම් පොකුණ - ඇත් පොකුණ

(3) කුමාර පොකුණ - නෙළුම් පොකුණ (4) ඇත්පොකුණ - කුමාර පොකුණ

33. මෙම සිතුවම දක්නට ලැබෙන විහාරස්ථානය කුමක් ද?



(1) සිතුල්පව්ව විහාරය

(2) සංගමු කන්ද විහාරය

(3) දඹුලු විහාරය

(4) මුල්ගිරිගල විහාරය

34. ගවයින්ගේ ආරක්ෂාව පතා කෙරෙන කිරිමඩු ශාන්ති කර්මය බහුලව දකගත හැකි පළාත් වන්නේ පහත පිළිතුරු අතරින් කුමක්ද?

(1) සබරගමුව - දකුණ (2) උතුර - දකුණ (3) මධ්‍යම - නැගෙනහිර (4) සබරගමුව - ඌව

35. දැදිගම සූතිඝර චෛත්‍යය ඉදිකර ඇත්තේ කුමන රජකෙනෙකුගේ උත්පත්ති ස්ථානය පදනම් කරගෙන ද?

(1) පළමුවන විජයබාහු රජතුමා (2) මහා පරාක්‍රමබාහු රජතුමා

(3) දෙවන පරාක්‍රමබාහු රජතුමා (4) නිශ්ශංකමල්ල රජතුමා

36. වර්තමානයේ අප භාවිතා කරන අංක ක්‍රමය හඳුන්වා දෙනු ලැබුයේ කුමන ජාතිකයන් ද?

(1) රෝම ජාතිකයින් (2) චීන ජාතිකයින් (3) අරාබි ජාතිකයින් (4) ග්‍රීක ජාතිකයින්

37. අතීතයේ පැවැති බදු නීතිය යටතේ වැව්වල ජලය භාවිතා කරන්නන්ගෙන් අයකළ බද්ද වන්නේ පහත පිළිතුරු අතරින් කුමක් ද?

(1) බොජකපති (2) දකපති (3) උදකබදු (4) මතරමපිබක

38. පුරාණ සෙල්ලිපිවල "රද්කොල් සම්දරු" ලෙස හඳුන්වා ඇත්තේ කවුරුන් ද?

(1) සෙන්පතියන් හැඳින්වීමට (2) රාජකීය භාණ්ඩාගාරික හැඳින්වීමට

(3) රාජකීය නිළධාරීන් හැඳින්වීමට (4) රජුගේ දරු පිරිස හැඳින්වීමට

39. " මාඝාත නීතිය" මගින් විස්තර වනුයේ පහත පිළිතුරු අතරින් කුමක් පිළිබඳවද?

(1) ජලාශ වල ජිවත් වන සතුන් නොමැරිය යුතු බවයි

(2) සොරකම් නොකළ යුතු බවයි

(3) මී හරක් එළහරක් එළුවන් ඝාතනය නොකළ යුතු බවයි

(4) කිසිදු සතෙකු නොමැරිය යුතු බවයි.

40. ධම්පියා අටුවා ගැටපදයට අනුව " මධුපාචිකා " ලෙස දක්වා ඇත්තේ කවුරුන් හැඳින්වීම සඳහා ද?

(1) රූමත් කාන්තාවන් (2) රූප ලාවන්‍ය කටයුතු වල දක්ෂ කාන්තාවන්ය

(3) සූප ශාස්ත්‍රයට දක්ෂ කාන්තාවන්ය (4) රාජ්‍ය පාලනයට සම්බන්ධ වූ කාන්තාවන්ය.

සියලුම හිමිකම් ඇවිරිණි.
All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

# දෙවන වාර පරීක්ෂණය 2018

**10 ශ්‍රේණිය** **ඉතිහාසය - II** **කාලය පැය 03 යි.**

නම/ විභාග අංකයඃ

- **(i)** කොටසේ පළමුවන ප්‍රශ්නය අනිවාර්ය වේ.
- **(ii)** කොටසින් ප්‍රශ්න 5 කට පිළිතුරු සපයන්න.
- පිළිතුරු සැපයිය යුතු මුළු ප්‍රශ්න සංඛ්‍යාව හයකි.

## I කොටස

(01) (අ) පහත (i) යටතේ දක්වා ඇති ඓතිහාසික ස්ථාන සියල්ල ම සපයා ඇති ශ්‍රී ලංකා සිතියමෙහි ද, (ii) යටතේ දක්වා ඇති ඓතිහාසික ස්ථාන සියල්ලම සපයා ඇති ලෝක සිතියමෙහි ද ලකුණු කොට නම් කරන්න.

(i) යාන් ඔය, කිරිඳි ඔය, හුරුළු වැව, කලා වැව, මාතොට, පොම්පරිප්පු, බූන්දල, උඩරංචාමඩම, අනුරාධපුරය, දඹුල්ල, අලිමංකඩ, ගෝකණ්ණ තිත්ථ (ල. 12)

(ii) ක්‍රිෂ්ණා ගඟ, රෝමය, මලක්කා සමුද්‍ර සන්ධිය, ඕලන්දය, පෘතුගාලය, අරාබි මුහුද (ල. 06)

(ආ) (i) පහත සඳහන් A B C D යටතේ දක්වා ඇති ඓතිහාසික තොරතුරු හා සම්බන්ධ පුද්ගලයින් කවුරුන්දැයි අනුපිළිවෙලින් ඔබේ පිළිතුරු පත්‍රයේ ලියා දක්වන්න.

A ශ්‍රී ලංකාවට පැමිණ මෙහි ඇති තතු දැක බලා ඒ පිළිබඳව වාර්තා ලියූ අරාබි ජාතිකයා කවුද?

B ලම්බකර්ණ වංසයේ ආරම්භක පාලකයා වන්නේ කවුරුන් ද?

C ශ්‍රී ලංකාව රතුකැට දිවයින ලෙස හැඳින්වූ අරාබි ජාතික ඉතිහාසඥයා කවු ද?

D ලාහුගල සෙල්ලිපියේ සඳහන් වන ආකාරයට මහ රැජිනක් ලෙස රාජ්‍ය පාලනයට සම්බන්ධ වූ කාන්තාව කවුද? (ල. 04)

- A හා B යටතේ දක්වා ඇති පින්තූර අධ්‍යයනය කොට අසා ඇති ප්‍රශ්න වලට පිළිතුරු අංක අනුපිළිවෙලින් ඔබේ පිළිතුරු පත්‍රයේ ලියන්න.


A

(ii) 1. 'A' පින්තූරයෙන් දක්වෙන්නේ කුමක් ද?

2. මෙම ස්ථානය පිහිටියේ කොහේ ද?

3. මෙම ස්ථානය පිහිටි දිස්ත්‍රික්කය කුමක් ද?

4. මෙවැනි ස්ථාන භාවිතා කළේ පැරණි සමාජයේ කවර පුද්ගලයින් සඳහා ද? (ල. 04)


B

(iii) 1. 'B' පින්තූරයෙන් දක්වෙන්නේ කුමක් ද?

2. මෙය නිමවන ලද්දේ කුමන ලෝහයෙන් ද?

3. මෙය හමු වූ ස්ථානය කුමක් ද?

4. මෙය නිර්මානය සඳහා යොදාගෙන ඇති ජල විද්‍යා මූලධර්මය කුමක් ද? (ල. 04)

## II කොටස

02 (i) ශ්‍රී ලංකාවේ ඉතිහාසය හැදෑරීමට යොදාගත හැකි සහිත්‍ය මූලාශ්‍රය අතර හටන් කාව්‍ය තුනක් නම් කරන්න. (ල. 03)

(ii) ඉතිහාසය හැදෑරීමට යොදා ගත හැකි සෙල්ලිපි වර්ග හතරක් නම් කරන්න. (ල. 04)

(iii) පුරා වස්තු වලින් ලබා ගත හැකි ප්‍රයෝජන දෙකක් උදාහරණ සහිතව පැහැදිලි කරන්න. (ල. 05)

(iv) පුරා විද්‍යාත්මක මූලාශ්‍රය විනාශ වීමට බලපාන හේතු තුනක් දක්වා ඒවා ආරක්ෂාකර ගැනීමට රටේ පුරවැසියෙකු වශයෙන් ඔබට අනුගමනය කළ හැකි ක්‍රියාමාර්ග තුනක් විස්තර කරන්න. (ල. 06)

03 (i) (අ) පහත A B හා C යටතේ දක්වා ඇති තොරතුරු වලට අදාල පිළිතුරු අනුපිළිවෙලින් ලියන්න.

A ශ්‍රී ලංකාව ජනාවාස කරන ලද මානවයා

B කඳුකර එළිමහන් දඩයම් වාසස්ථානයක්

C ගල් මෙවලම් තාක්ෂණය වෙනුවට ලෝහ මෙවලම් තාක්ෂණය ආරම්භ වූ යුගය (ල. 03)

(ii) පහත A B C හා D යටතේ දක්වා ඇති තොරතුරු වලට ගැලපෙන පිළිතුරු, වරහන් තුළින් තෝරා අනුපිළිවෙලින් ලියා දක්වන්න.

A භෂ්මාවශේෂ සහිත කුඩාමැටි බඳුන් විශාල මැටි බඳුනක් තුළ බහා තැම්පත් කරනු ලබන සුසාන ක්‍රමය

B මුල් ඓතිහාසික යුගයේ ජනාවාස හැඳින්වූ නම

C බ්‍රාහ්මී සෙල්ලිපි වල, අමුණ හඳුන්වා ඇති නම

D ජනතාව විසින් අතහැර දමූ වැව් ගම්මාන හැඳින් වූ නම

(නගරයේ ප්‍රධාන වාස්තු ශිල්පියා, වාපී ගම්මාන, අවරණ, පන්සල, නියම් ගම්, ඔලගම් ශිලාමංජුසා, හරණී) (ල. 04)

(iii) ප්‍රාග් ඓතිහාසික යුගයේ මානවයාගේ ආහාර රටාව සැකසී තිබුනේ පරිසරයට අනුකූලවයි. මෙය උදාහරණ දෙකක් දක්වමින් පැහැදිලි කරන්න. (ල. 05)

(iv) ඓතිහාසික යුගයට අයත් සුසාන 03ක් දක්වා එම යුගයට අයත් අභිචාර විධි පිළිබඳව කෙටි හැඳින්වීමක් කරන්න. (ල. 06)



04 (i) A - මෙම පින්තූරයේ දක්වෙන්නේ කුමක් ද?

B - මෙය හමුවූ ස්ථානය කුමක් ද?

C - මෙමගින් අනාවරණය කර ගත හැකි ඓතිහාසික තොරතුරක් ලියන්න. (ල. 03)

(ii) දේශපාලන බල විකාශනයේ දී රජුට සහාය වූ නිළධාරීන් පිරිසකගේ කාර්ය භාරයන් කීපයක් A, B, C, D අනුපිළිවෙලින් දක්වේ. ඔවුන් හැඳින්වීමට සෙල්ලිපිවල භාවිතා කළ නම් වරහන් තුළින් තෝරා ලියන්න.

A - කාසි අච්චු ගැසීමේ අංශ ප්‍රධානි

B - වෙළඳ කටයුතු භාර ප්‍රධානි

C - රාජ්‍ය ලේඛනාගාර ප්‍රධානි

D - නාට්‍ය අංශයේ ප්‍රධානි

(අස අදෙක, රූප අදෙක, පන අදෙක, කන පෙඩික, නට අදෙක) (ල. 04)

(iii) පැරණි ශ්‍රී ලංකාවේ රාජ්‍ය උරුමය ලැබුන ආකාරයන් දෙකක් දක්වා උදාහරණ සහිතව කෙටියෙන් විස්තර කරන්න. (ල. 05)

(iv) චෝළ පාලකයින්ට විරුද්ධව කටයුතු කිරීමට I වන විජයබාහු රජතුමා ගන්නා ලද පියවර 03 ක් පැහැදිලි කරන්න. (ල. 06)

05 (i) පහත A B C D වලින් අසා ඇති තොරතුරු වලට අදාළ පිළිතුර අනුපිළිවෙලින් ලියන්න.

A ගම්කයන් ගෘහපතින් අතරින්ම පත් වූ කෙනෙකු බව බුද්ධඝෝෂ හිමියන් විසින් සඳහන් කර ඇති ග්‍රන්ථය

B ශ්‍රී මහා බෝධි රෝපණ උත්සවයට ක්ෂත්‍රියයන් පැමිණි දකුණු ලක ප්‍රදේශයක්

C වසභ රජතුමාගේ කාලයේ දී නකදිව පාලනය කළ ඇමතිවරයෙකු පිළිබඳව සඳහන් වන අභිලේඛනය (ල. 03)

(ii) පහත සඳහන් රජවරුන්ගේ රාජත්ව සංකල්ප අනුපිළිවෙළින් ලියන්න.

1. මහසෙන් රජු
2. කුටකණ්ණ අභය රජු
3. I වන කාශ්‍යප රජු
4. නිශ්ශංකමල්ල රජු (ල. 04)

(iii) දුටුගැමුණු රජතුමාගේ ආගමික හා දේශපාලන සේවා එක බැගින් ලියා කෙටියෙන් විස්තර කරන්න.

(ල. 05)

(iv) රටේ ආර්ථිකය සමෘද්ධිමත් කරමින් කලාපීය අවශ්‍යතා වලට අනුග්‍රහය දැක්වූ වසභ රජුගේ කාර්යය කරුණු 03 ක් ඔස්සේ පැහැදිලි කරන්න. (ල. 06)

06 (i) ශ්‍රී ලංකාවේ පැරණි වෘත්තීන් අතර වැදගත් වෘත්තියක් වූයේ ගුරු වෘත්තියයි. ඔවුන් ආචාර්ය යනුවෙන් හඳුන්වා ඇත. එවැනි ආචාර්යවරු තිදෙනෙක් නම් කරන්න. (ල. 03)

(ii) පහත A සිට D දක්වා ප්‍රකාශ වලට අදාල පිළිතුරු අනුපිළිවෙලින් ලියා දක්වන්න.

A රජයේ සියලු කටයුතු ලේඛනගත කිරීම සහ එම ලේඛන ආරක්ෂා කිරීම

B වසභ රජුගේ පාලන සමයේ නාගදීපය පාලනය කළ ඇමතිවරයා

C ගම් දහයක් නියෝජනය වන පරිදි ප්‍රාදේශීය පාලන කටයුතු වලට සම්බන්ධ වූ මණ්ඩලය

D දරුණු උණ රෝගීන්ට ප්‍රතිකාර කිරීමට ඉදිකළ විශේෂ රෝහල (ල. 04)

(iii) A පැරණි සමාජයේ ගොවිතැන් කළ ක්‍රම දෙක නම් කරන්න. (ල. 02)

B ඉහත ගොවිතැන් ක්‍රම දෙකෙන් එකක් පිළිබඳ පැහැදිලි කරන්න. (ල. 03)

(iv) පැරණි ශ්‍රී ලංකාවේ ආර්ථික කටයුත්තක් ලෙස විවිධ කර්මාන්ත පැවති බව නිදසුන් 03 ක් මගින් පැහැදිලි කරන්න. (ල. 06)

07 (i) පහත A B C ප්‍රකාශන වලට අදාල නිවැරදි පිළිතුරු සපයන්න.

A වෙර යොදා බලයක් යෙදීමෙන් ගල්පතුරු ගලවා ගෙන මෙවලම් තැනීමේ තාක්ෂණය හැඳින්වීමට භාවිතා කළ නම

B ජලයේ ප්‍රමිතිය හා සිසිලනය ආරක්ෂා කිරීම සඳහා වියළි කලාපීය ජනතාව තැනූ ළිං විශේෂය

C අකුණු සැර වලින් ආරක්ෂා වීමට රුවන්වැලි සෑය මුදුනේ තනා ඇති උපකරණය ඓතිහාසික මූලාශ්‍ර වල හඳුන්වා ඇත්තේ (ල. 03)

(ii) පුරාණයේ පටන්ම ශ්‍රී ලංකාවේ යකඩ නිස්සාරණ තාක්ෂණයක් භාවිතා කළ බවට සාධක හමුවූ ස්ථාන 02 ක් ලියන්න. (ල. 04)

(iii) පුරාණ ගැමි ජනතාව කෘෂි කාර්මික අවශ්‍යතා සඳහා යාතුකාර්මික පූජා පැවැත් වූ බවට නිදසුන් දෙකක් දක්වා කෙටියෙන් පැහැදිලි කරන්න. (ල. 05)

(iv) අතීත ජනයා තම අවශ්‍යතා ඉටුකර ගැනීමේ දී කාලයෙන් උපරිම ප්‍රයෝජන ගත්තා ලදී. ඔවුන් කාලය මැනීම සඳහා විවිධ මිනුම් ක්‍රම භාවිතකළ බව උදාහරණ තුනක් ඇසුරින් විස්තර කරන්න.

(ල. 06)

08 (i) පහත ප්‍රකාශන වලට අදාළ නිවැරදි පිළිතුරු A B C අනුපිළිවෙලින් ලියන්න. (ල. 03)

A ඓතිහාසික යුගයේ සමාජ සංවිධානය තුළ සිටි සාමාන්‍ය ජනතාව හැඳින් වූ නම

B අපරාධකරුවා අල්ලා දෙන තුරු ගම් වැසියන් විසින් රජයට ගෙවිය යුතු බද්ද

C වර්තමානයේ මෙන්ම පුරාණයේ ද ව්‍යංජන රසවත් කිරීමට කුළු බඩු වර්ග භාවිතා කළ කුළු බඩු වර්ග හැඳින් වූ නම

(ii) අතීත ශ්‍රී ලංකාවේ වෙළඳාම ක්‍රමවත් කිරීම සඳහා හතරවන උදය රජු හෝපිටිගමුව සෙල්ලිපියේ දක්වා ඇති වෙළඳ නීති හතරක් ලියන්න. (ල. 04)

(iii) "අතීත කාන්තාව සමාජයේ ගරු බුහුමන් ලැබූ අයෙකි. " කියමන උදාහරණ දෙකක් දක්වමින් පහදන්න. (ල. 05)

(iv) සමාජ යහපත උදෙසා නීති හා සම්ප්‍රදායන් ඉවහල් කරගත හැකි ආකාරය පුරාණ සමාජයෙන් උදාහරණ 03 ක් ගෙන පැහැදිලි කරන්න. (ල. 06)

09 (i) පහත A B C යටතේ දක්වා ඇති පාලකයන් පාලනය කළ රාජධානිය අනුපිළිවෙලින් නම් කරන්න.

A දෙවන පැරකුම් රජතුමා

B මහා පරාක්‍රමබාහු රජතුමා

C මහසෙන් රජතුමා (ල. 03)

(ii) රජරට ශිෂ්ඨාචාරය බිඳවැටීමෙන් පසු, දෙවනි නාගරිකරණය බිහිවීමට පෙර ප්‍රාදේශීය පාලන මධ්‍යස්ථාන පිහිටුවා ගත් දෙදෙනෙක් හා ඔවුන් පිහිටුවාගත් පාලන මධ්‍යස්ථාන නම් කරන්න. (ල. 04)

(iii) පොළොන්නරු රාජධානිය බිඳවැටීමට බලපෑ හේතු දෙකක් දක්වා, ඒවා ලුහුඬින් විස්තර කරන්න. (ල. 05)

(iv) දෙවනි පරාක්‍රමබාහු රජුගේ දේශපාලනික හා ආගමික සේවාවන් එක බැගින් ලියා විස්තර කරන්න.

(ල. 06)

(01) (අ) (i) ප්‍රශ්නයට අදාළ ශ්‍රී ලංකා සිතියම



(01) (අ) (ii) ප්‍රශ්නයට අදාළ ලෝක සිතියම



## පිළිතුරු පත්‍රය - I කොටස

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| (01) - 1 | (02) - 4 | (03) - 2 | (04) - 3 | (05) - 2 | (06) - 4 | (07) - 3 | (08) - 4 | (09) - 2 | (10) - 1 |
| (11) - 3 | (12) - 2 | (13) - 1 | (14) - 2 | (15) - 2 | (16) - 3 | (17) - 2 | (18) - 1 | (19) - 3 | (20) - 4 |
| (21) - 3 | (22) - 3 | (23) - 1 | (24) - 3 | (25) - 2 | (26) - 1 | (27) - 3 | (28) - 4 | (29) - 2 | (30) - 1 |
| (31) - 2 | (32) - 3 | (33) - 4 | (34) - 4 | (35) - 2 | (36) - 3 | (37) - 2 | (38) - 3 | (39) - 4 | (40) - 3 |

(ලකුණු 40 × 2 = 80)

## II කොටස

(01) (අ) (i)




(ලකුණු 12 යි)

(ii)




(ලකුණු 06 යි)

01. (ආ) (i) ලංකා සිතියමේ ලකුණු කර ඇත.
(ii) ලෝක සිතියමේ ලකුණු කර ඇත.

(ආ) (i) A - ඉබන් බතුතා B - වසභ රජතුමා C - අල්-බලසූරි D - චූල සීවලී (ල. 04)
(ii) 1. සුසාන භූමියක් 2. ඉබ්බන් කටුව 3. මාතලේ දිස්ත්‍රික්කය 4. පරුමකයින් සඳහා (ල. 04)
(iii) 1. ඇත් පහණ 2. ලෝකඩ 3. කෑගල්ල දිස්ත්‍රික්කයේ දැදිගම කොටවෙහෙර
4. ස්ථිතික ජලවිද්‍යා මූලධර්මය (ල. 04)

02 (i) සීතාවක හටන, කොන්ස්තන්තීනු හටන, ඉංග්‍රීසි හටන (ල. 04)
(ii) ලෙන් ලිපි, ගිරිලිපි, ටැම්ලිපි, පුවරු ලිපි, ආසන ලිපි මින් 04 ක් ලිවීමට (ල. 04)
(iii)
- පැරණි ජනතාවගේ විවිධ හැකියා, කුසලතා, පැරණි සංස්කෘතිය, තාක්ෂණය, විදේශ සබඳතා, හා ඔවුන්ගේ ජීවන ක්‍රමය ආදි අංශ පිළිබඳව අවබෝධය ලබා ගැනිමට.
- සාහිත්‍ය මූලාශ්‍ර වල සඳහන් තොරතුරු, පුරා විද්‍යාත්මක වශයෙන් සනාථ කර ගැනීමෙන් තොරතුරු වල විශ්වාසනීය භාවය වැඩි වීම.
- සාහිත්‍ය මූලාශ්‍ර වල අඩුපාඩු පුරවා ගැනීමට හා අළුත් තොරතුරු ලබා ගැනීමට, සාහිත්‍ය කෘතිවල සඳහන් කරුණු සනාථ කර ගැනීමට, මෙයින් දෙකක් උදාහරණ සහිතව විස්තර කිරීමට (ල. 05)

(iv) <u>පුරා විද්‍යාත්මක මූලාශ්‍ර විනාශ වීමට බලපාන හේතු</u>
- සීඝ්‍ර නාගරීකරණය, ජනාවාස ව්‍යාප්තිය, මංමාවත් තැනවීම, ගොඩනැගිලි ඉදිකිරීම, කෘෂි කාර්මික කටයුතු මේවායින් 03 ක් ලිවීමට (ල. 03)
- පුරා විද්‍යාත්මක මූලාශ්‍ර, ඇති ස්ථාන හාරා විනාශ නොකිරීම
- පුරා වස්තු ආරක්ෂා කිරීමට රජය පනවා ඇති නීති - රීති අනුගමනය කිරීම.
- පුරා වාස්තු විනාශ කරන්නන් නීතියේ රැහැනට හසුකර දීම
- පුරා වස්තු විනාශ කරන්නන් හට රැකුල් නොදීම මේවායින් තුනක් ලියා විස්තර කිරීමට (ල. 03)

03 (i) A හොමෝ සාපියන් B බණ්ඩාරවෙල / හෝර්ටන්තැන්න
C පූර්ව ඓතිහාසික යුගයේ දීය. (ල. 03)

(ii) A හරණි සුසානය
B වාපී ගම්මාන
C අවරණ
D ඔලගම් (ල. 04)

(iii)
- සතුන් දඩයම් කර ආහාරයට ගැනීම
- ශාක ආහාර ගැනීම

ගවයා, කුළු මීහරකා, කැති වළහා, වල් ඌරා, ගෝණා, තිත්මුවා, මීමින්නා, ඉත්තෑවා, හාවා, දඬුලේනා, හම්බාවා, මුගටියා, උරුලෑවා, වඳුරා, වලිකුකුළා, හබන් කුකුළා සහ තලගොයා, සතුන් දඩයම් කර ආහාරයට ගැනීම.

- ⋆ මිරිදිය මාළු වර්ග ද ආහාරයට ගැනීම ⋆ වල්දෙල් හා කැළෑ කෙසෙල් ආහාරයට ගැනීම
- ⋆ කැලෑ දෙල් ඇට පුළුස්සා ආහාරයට ගැනීම
- ⋆ ගෝනල, කටු අල, කිතුල් ඇට, දෝතලු, ඇට වල මදය අනුභව කර තිබීම
- ⋆ ගොළුබෙල්ලන් ආහාරයට ගැනීම (ල. 2 + 3 = 5)

(iv)
- ⋆ කිතුල්ගල බෙලිලෙන ⋆ බෙල්ලන් බැඳි පැලැස්ස
- ⋆ පාහියන්ගල
- ⋆ මල සිරුරු, ගුහා ඇතුලත වළ දමා දිරාපත් වීමට හැර මිනිස් හිස්කබල ගෙන එම හිස් කබලේ රළුවට පිහිටා තිබුණු දාර සහ පිටතට නෙරා තිබෙන කොටස් ගලක උලා මට්ටම්කර එක් පැත්තක රතු පැහැති ගුරුගල් ආලේපකර තිබේ.
- ⋆ ඇටසැකිලි නමා වකුටුකර වැළලීම (ල. 3 + 3 = 6)

04 (i) A පබළු මාලයක් / කානේරියන් මාලය B දඹුල්ල ඉබ්බන්කටුව ප්‍රදේශය
C ප්‍රභූන්ගේ ජීවිතයේ සුඛිත මුදිත බව / විදේශ සබඳතා (ල. 03)

(ii) A රූප අදෙක B පන අදෙක
C කන පෙඩික D නට අදෙක (ල. 04)

(iii) පියාගෙන් පුතාට - කාවන්තිස්ස ⟶ දුටුගැමුණු / වසභ ⟶ වංකනාසික තිස්ස

සහෝදරයාගෙන් සහෝදරයාට උදාහරණ ඇසුරින් පැහැදිලි විය යුතුයි.
දුටුගැමුණු ⟶ සද්ධාතිස්ස
දේවානම්පියතිස්ස ⟶ උත්තිය ⟶ මහාශිව ⟶ සූරතිස්ස ආදී ලෙස (ල. 2 + 3 = 5)

(iv) 1. භෞමික අඛණ්ඩතාවය ආරක්ෂා කිරීම.
2. පොළොන්නරුව සිය පාලන මධ්‍යස්ථානය කර ගැනීම.
3. සංවිධානාත්මක සටන් ව්‍යාපාරයක් දියත් කිරීම. පිළිබඳව විස්තර විය යුතුය. (ල. 06)

05 (i) A - සමන්තපාසාදිකාව B - කතරගම හෝ චන්දන ගාම
C - වල්ලිපුරම් රන් පත (ල. 03)

(ii) i. දේවත්ව / මින්නේරි දෙවියන්
ii. නර ඉසෙර / නරේශ්වර
iii. ආලකමන්දාධිපති / අලකපය මහ රජ / කුවේර
iv. සක්විති / චක්‍රවර්තී / කාලිංස චක්‍රවර්තී (ල. 04)

(iii) දේශපාලන - මාතොට අන්තර්ජාතික වරාය එළාර නම් පාලකයාගෙන් මුදා ගැනීම
ප්‍රථම සංවිධානාත්මක සටන් ව්‍යාපාරයකට නායකත්වය දීම
පරුමක වරුන් ඒකාබද්ධ කර ගැනීමට සමත් වීම
ආගමික - ස්ථූප ඉදිකිරීම - (රුවන්වැලි සෑය / මිරිසවැටිය)
ස්ථූප ඉදිකරන්නන්ට වැටුප් ලබා දීම. ආහාරපාන ආදියෙන් සංග්‍රහ කිරීම (දන්සැල් පැවැත්වීම)
ලෝවාමහාපාය ඉදිකර භික්ෂූන් වහන්සේලාට විනය කර්ම සිදු කිරීමට අවස්ථාව ලබා දීම. (ල. 3 +3 = 06)

(iv) විශාල ප්‍රමාණවත් වැව් ඉදිකිරීමේ ප්‍රමුඛයා වීම. විශාල වැව් 11 ක් ඉදිකිරීම
වාරිමාර්ග ඉදිකිරීම - උමං ජල මාර්ග තැනීම
ඉන්දියාවේ ක්‍රිෂ්ණා නදිය අසබඩ වූ නියගක් නිසා ඇති වූ ආහාර හිඟයට පිළියම් යෙදීම.
බදු සහන ලබා දීම. ආදී ලෙස..... (ල. 06)

06 (i) ධනු ආචරිය / හති ආචරිය / අස ආචරිය (ල. 03)

(ii) A මහලේ
B සෘෂිගිරි
C දසගම් ඇත්තන්
D උපසග්ග රෝග නාස (ල. 04)

(iii) හේන්ගොවිතැන / මඩ ගොවිතැන (වී)
එකක් පිළිබඳව විස්තර කළ යුතුයි. (ල. 2 + 3 = 05)

(iv)

| | | |
|---|---|---|
| යකඩ කර්මාන්තය | - | සෙල්ලිපිවල "කබර" නමින් හැඳින්වීම. මුතුගල්ල සෙල්ලිපියේ මජ්ජිම නම් කම්මල්කරු පිළිබඳ |
| රන් කර්මාන්තය | - | රන්කරුවන් "තුලාධාර" ලෙස හඳුන්වා තිබීම |
| ඇත්දත් කැටයම් කලාව | - | වේගිරිය සෙල්ලිපිය "දටික සුමන" නම් ඇත්දත් ශිල්පියකු පිළිබඳ සඳහන් වීම |
| කුඹල් කර්මාන්තය | - | කුම්භකාර ලෙස හැඳින්වීම, මැටිභාණ්ඩ |
| පේෂ කර්මාන්තය | - | වෙහෙරකෙම සෙල්ලිපියේ "තත්වය" වචනය. |

07 (i) A පීඩන ශල්කනය B ඌරා කැට ලිං C වජ්‍රචුම්භට (ල. 03)

(ii) බලංගොඩ සමනල වැව යකඩ උදුන
සීගිරිය අලකොළවැව දෙනිගහ ඇලකන්ද යකඩ උදුන (ල. 04)

(iii) i. කෘෂි උවදුරු වලක්වා ගැනීමට කෙම් පහන් ක්‍රම අනුගමනය කිරීම.
මී තෙල් තල තෙල් පහන් දල්වා පූජා පැවැත්වීම. ......... ආදී
ii. ගවයින්ගේ ආරක්ෂාව සඳහා කිරිමඩු ශාන්තිකර්මය පැවැත්වීම.
ගව හක්ක මැටි කොතල ගිණි මැල භාවිතා කරමින් දේවාල තනා නර්තන පැවැත්වීම. (ල. 05)

(iv) i. කන්න ක්‍රමය - කෘෂිකාර්මික කටයුතු සඳහා
මාස ක්‍රමය - චන්ද්‍රයාගේ ගමන අනුව
වර්ෂ ක්‍රමය - (වස , හවජර)
තිථිය - දිනය (කුටකණ්ණ අභය රජුගේ රජගල ලිපිය)
මූර්ත - (මොහොත) මේවා විස්තර කළ යුතුයි. (ල. 03 + 03 = 06))

08 (i) A කුඩීන්
A ගෘහ දණ්ඩ
A කටුක භාණ්ඩ (ල. 03)

(ii)
- හොපිටිගම, වෙළඳපල සීමාවේ වෙළෙඳාමේ කරන අයගෙන් පමණක් බදු අය කර ගත යුතු අතර වෙළඳපොල පසුකොට යන්නවුන්ගෙන් බදු අය නොකිරීම.
- බුලත් පුවක් හිරු එළිය නොවැටෙන ලෙස ආවරණයකර වෙළඳාම් කිරීම.
- නිළධාරීන් ට නොපෙන්වා එම වෙළඳපලේ භාණ්ඩ විකුණන අයගෙන් දෙගුණයක් බදු අයකල යුතු බව.
- පොහෝ දින වෙළඳාම තහනම් බව (ල. 04)

(iii)
★ රට පාලනය කළ බිසෝවරු සිටීම. චූලසීවලී / ලීලාවතී)
★ සූප ශාස්ත්‍රයේ දක්ෂ වීම. (සාලිය කුමරුගේ බිරිඳ අශෝක මාලා)
★ ප්‍රාදේශීය පාලනයට සම්බන්ධ වූ බිසෝවරු සිටීම. (පරුමුකලු - සුමනා)
★ පතිදම් ආරක්ෂා කර ගනිමින් ජීවත් වීම.

ආදී තොරතුරු මගින් විස්තර කළ යුතුය. (ල. 05)

(iv)
★ නීති සම්පාදනයට ආයතන තිබීම. - වදාල / රාජ සභාව
★ නීති ක්‍රියාත්මක කිරීමට ආරක්ෂක නිළධාරින් පත්කොට තිබීම. (මේයික්කාපර් / දණ්ඩ නායක)
★ බදු නීති පැනවීම - දකපති / බොජකපති / මතරමජිබක ආදී ලෙස
★ පරිසර සංරක්ෂණ නීති ක්‍රියාත්මක කිරීම.
කිසිදු සතෙකු නොමැරිය යුතු බව - අමණ්ඩ ගාමිණී අභය
නිසිකලට සී සෑම නොකරණ අයට දඩ ගැසීම - කොණ්ඩවට්ටවාන් ටැම් ලිපිය
වනාන්තර වල ගහකොළ ආරක්ෂා කිරීම.
"වල්වල දඩුපත් නොකපනු ඉසා" ආදී ලෙස විස්තර විය යුතුයි. (ල. 06)

09 (i) A දඹදෙණිය B පොළොන්නරුව C යාපහුව

(ii) යාපහුව - සුභ සෙන්පති
ගෝවින්ද මලය - භුවනෙකබාහු ආදිපාද
ගංදෙණිය - සංඛ සෙනෙවි

(iii) දුර්වලපාලකයන් බලයට පත්වීම
කාලිංග පාණ්ඩ්‍යවංශික ගැටුම්
ආර්ථික පරිහානිය
කාලිංග මාඝ ආක්‍රමණය

(iv) දේශපාලන - චන්ද්‍රභානු පළමු ආක්‍රමණ පරාජය
- කාලිංග මාඝ පරාජය
චන්ද්‍රභානු දෙවන ආක්‍රමණය පරාජය
ආගමික - දඹදෙණියේ දළදා මන්දිරයක් ඉදිකිරීම